වගා මළු එල්ලා තැබීමට තිරස් අතට අඟල් 6--7 පරතරය ඇතිව අඟල් 2ෘ2 පොළු ගසා ගන්න. ලණු, කම්බි කොකු සහ කම්බි ආධාරයෙන් රූපයේ ආකාරයට වගා මළු පේලි 02ක් අතර පරතරය අඟල් 09 වන ලෙස තිරස් පොලු වල වගා මළු එල්ලා ගන්න. දිලීර වර්ධනය සම්පූර්ණ වීම සඳහා දින 10--15 ගතවේ. වර්ධන කාලය තුළ වගා මලු හොඳින් නිරීක්ෂණය කර ආසාදිත වගා මළු ක්‍රමාණුකූලව විනාශ කර දමන්න.




## 05. වගා මලු විවෘත කිරීම.

මේ සඳහා වගා ගෘහයක් තිබිය යුතු අතර එය පහත ආකාරයට සාදා ගත හැකිය.

**මල් පිපීම සඳහා වන වගා ගෘහය**

**මල් පිපීම සඳහා අවශ්‍ය සාධක**

- උෂ්ණත්වය 26°C-28°C
- ආර්ද්‍රතාවය 85%
- ආලෝකය 50%
- මනා වාතාශ්‍රයක්




මෙහිදි දිලීර වර්ධනය වූ වගා මලු එල්ලා තැබීම සඳහා අඟල් 6--7 පරතරය ඇතිව තිරස් අතට ගසන ලද අඟල් 2x2 පොලු තිබිය යුතුය. ලිදීර වර්ධනය වූ වගා මලු බීජෞෂණ කාමරයේ තිබූ ආකාරයටම එල්ලන්න. පසුව ජීවාණුහරණය කල බ්ලේඩ් එකක් ආධාරයෙන් අඟල් 1/2 පමණ තිරයේ කැපුම් 8--10 වගා මල්ලක ඇති කරන්න. දිනකට දෙවරක් ජලය මීදුමක් ලෙස වගා මළු වලට ඉසින්න.

## 06. අස්වනු නෙලීම සහ වෙළඳපලට ඉදිරිපත් කිරීම

පිරිසිදු භාජන 02ක්
කැපෙන කතුරක් / පිහියක්
නාස් ආවරණයක්

කැපුම් දාර ඇති කර දින 5--7 න් මල් කැකුළු දක්නට ලැබේ. ඉන් දින 3න් අස්වනු නෙලා ගත හැකිය. පිදුරු තැවරුණු කොටස කපා එක් භාජනයකටත් හොඳ මල් එක් භාජනයකටත් දමන්න. වගා මල්ල තුල කුඩා මල් කැකුළු දක්නට ඇති විට කැපුම් දාර ඇති කරමින් මල් පිපීමට ඉඩ හරින්න. මෙලෙස මාස 1 - 1 1/2 අස්වැන්න නෙලිය හැකි අතර කි.ග්‍රෑ. 1.5 ක වගා මල්ලකින් බෑගයකින් ග්‍රෑ 400-500 බිම්මල් අස්වැන්න ලබා ගත හැකිය.

## 07. වෙළඳපොලට ඉදිරිපත් කිරීම.

පාරිභෝගික ආරක්ෂිත පණතට අනුකූලව ලේබලයක් සහිත අඟල් 7 හෝ අඟල් 9 පළල සිදුරු රහිත පොලිතින් මළු වල ඇසිරීමෙන් සාමාන්‍ය උෂ්ණත්වයේ දින 4 ද ශීතකරණයක සිදුරු සහිත පොලි ප්‍රොපලීන් මළුවල දින 4ක්ද කල්තබා ගත හැක.

ලේබලයේ වෙළඳනාමය නිෂ්පාදකයාගේ නම, ලිපිනය, නිෂ්පාදිත දිනය, කල් ඉකුත්වීමේ දිනය, ප්‍රමාණය, ලි.ප. අංකය සහ මිල පැහැදිලිව දැක්විය යුතු අතර කිසියම් ලෙඩකට මෙය සුදුසුය යන්න ඇතුළත් නොකළ යුතුය. රසවත් ආහාර වට්ටෝරුවක් ඇතුලත් කිරීම වඩාත් සුදුසුය.

**ලියාපදිංචි අංකයක් ලබා ගැනීම**

ස්වයං රැකියාවක් ලෙස ලියාපදිංචි වීම සඳහා පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය තොරතුරු ලබාගත හැකිය. මේ සඳහා අවශ්‍ය සහතිකය අප ආයතනයේ පුහුණු ලාභීන්ට අප ආයතනයෙන් ලබා ගත හැකිය. ඒ සඳහා අධ්‍යක්ෂතුමා වෙත ඔබගේ අවශ්‍යතාවය පැහැදිලි ලිපියක් මඟින් ඉදිරිපත් කල යුතුය.

**බිම්මල් බීජ ලබා ගත හැකි රාජ්‍ය ආයතන**

| | |
|---|---|
| කුණ්ඩසාලේ බීජ හා රෝපණ අංශය | 081 2420471 |
| ගන්නෝරුව අලවි පියස | 081 3845285 |
| තෙලිජ්ජවිල පර්යේෂණ මධ්‍යස්ථානය | 041 2240464 |
| මාකඳුර කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය | 031 2299625 |
| පොතුහැර ජතික පුහුණු මධ්‍යස්ථානය | 037 2237800 |
| අපනයන සංවර්ධන මණ්ඩලය රත්මලාන | 011 2725471 |


**තාක්ෂණික උපදෙස්** - ඉන්ද්‍රා ඊරියගම - ඒකකභාර පර්යේෂණ නිළධාරි, බිම්මල් ඒකකය.

**සංස්කරණය** - කේ.බී. වහුන්දෙනිය - අධ්‍යක්ෂ, උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය

**පරිගණක සැකසුම** - කේ.ඒ. ඉන්දික කුමාර ජයසිංහ - පර් උප සහකාර


උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ප්‍රකාශනයකි.

# පිදුරු මත වගා කරන ඔයිස්ටර් බිම්මල්

බිම්මල් වගාව තාක්ෂණික පත්‍රිකා අංක 02




උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය.
තැ.පෙ. 11, ගන්නෝරුව, පේරාදෙණිය
දුරකථන අංක : 081 2388011 - 13



අනුග්‍රහය -- KOPIA - Sri Lanka බිම්මල් ව්‍යාපෘතිය

ඔයිස්ටර් බිම්මල් වගාව සඳහා ලංකාවේ ඕනෑම ප්‍රදේශයක් සුදුසු වන්නේ වර්ධක අවශ්‍යතාවයන් පහසුවෙන් ලබාදිය හැකි බැවිනි. ලී කුඩු මාධ්‍යය තුළ ඔයිස්ටර් බිම්මල් වගාව ස්වයං රැකියාවක් ලෙස වඩාත් ප්‍රචලිත වී ඇත්තේ අමු ද්‍රව්‍යය පහසුවෙන් අඩු මිලකට ලබාගත හැකි වීමත් වගා තාක්ෂණය පහසුවීමත් නිසාය.

සාර්ථක ඔයිස්ටර් බිම්මල් වගාවක් සඳහා තෝරා ගනු ලබන මාධ්‍යයේ ලිග්නීන්, සෙලියුලෝස් හා හෙමිසෙලියුලෝස් අඩංගු විය යුතුය.

පිදුරු කෘෂි අවශේෂයක් වන අතර සෙලියුලෝස් 28.3% හා ලිග්නීන් 6% පමණ අඩංගු අතර නයිට්‍රජන්ද අඩංගුව ඇත. ලංකාවේ වී වගා කරන කන්න දෙකේදී වී වගා කරන ප්‍රදේශ වලින් පිදුරු ලබා ගත හැකි අතර හොඳින් වියලා කඳු ආකාරයට නොතෙමෙන ලෙස අසුරා ගබඩා කර තබාගත හැකිය.

බිම්මල් වගාකරන බොහෝ රට වල ඔයිස්ටර් බිම්මල් වගාව සඳහා විවිධ වූ ක්‍රමවේදයන් ඔස්සේ පිදුරු, මාධ්‍යයක් ලෙස භාවිතා කර ඔයිස්ටර් බිම්මල් වගා කරනු ලැබේ. උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ බිම්මල් ඒකකය මඟින් සිදු කල පර්යේෂණයක තොරතුරක් ලෙස පිදුරු මාධ්‍යය භාවිතා කර ඔයිස්ටර් බිම්මල් වගා කල හැකි පහසු ක්‍රමවේදයක් පහතින් දැක්වේ.

මේ සඳහා ලීකුඩු මාධ්‍යයේ ඔයිස්ටර් බිම්මල් වගාව සඳහා අවශ්‍ය උපකරණ සහ ගොඩනැගිලි තිබිය යුතුය.

**වගා ක්‍රමයේ අවස්ථා,**

1. පිදුරු පෙඟවීම.
2. ජීවානුහරණය
3. බීජ යෙදීම සහ වගා මළු සෑදීම.
4. බීජෞෂණයට වගා මළු පිළියෙල කිරීම සහ බීජෞෂණය.
5. වගා මළු විවෘත කිරීම.
6. අස්වනු නෙලීම.
7 වෙළඳපොලට ඉදිරිපත් කිරීම.

**01. පිදුරු පෙඟවීම (කි.ග්‍රෑම් 1.5ක වගාමළු 5ක් සඳහා)**

1. වියළි පිදුරු කි. ග්‍රෑම් 03ක්.
2. ටැංකියක් හෝ බැරලයක්.
3. ලී මැස්සක්

ටැංකිය හෝ බැරලයට පිදුරු දමා එයට ජලය පුරවාගන්න. පිදුරු ජලය මත පාවෙන බැවින් ඒ මත බරක් තබන්න. පොඟවන කාලය අළුත් සහ පරණ පිදුරු අනුව වෙනස් වන අතර පිදුරු පෙඟවීමට අවශ්‍ය වන්නේ දිලීර වර්ධනයට අවශ්‍ය මෙලෙක් බව ලබාදීමටය. මෙලෙස පැය 8--10 තුළ පිදුරු පොඟවා ජලය වෑස්සීම සඳහා ලී මැස්සක් මත පිදුරු ගොඩගසන්න.

**02. ජීවානුහරණය**

ක්‍රම දෙකකට සිදු කල හැකිය.

☛ හුමාලය මඟින්
☛ උතුරන ජලය මඟින්

2.1 **හුමාලය මඟින් ජීවානුහරණය**

☛ පියනේ කුඩා සිදුරක් ඇති හිස් ග්‍රීස් / ග්ලූකෝස් බැරලය.
☛ අඟල් 5 1/2 උස දැල් ආධාරකය
☛ ඉන්ධන පිරිමැසුම් ලිප
☛ පොලිසැක් මළු

වැඩි ජලය ඉවත් කරගත් පිදුරු පොලිසැක් මළු වලට තරමක් ලිහිල්ව පුරවා ගන්න. එය පහත ආකාරයට බැරලය තුළ අසුරා ඉන්ධන පිරිමැසුම් ලිප භාවිතයෙන් පියනේ සිදුරෙන් හුමාලය පිට වූ මොහොතේ සිට පැය 03ක් ඒකාකාර උෂ්ණත්වයක් ලබා දෙමින් ජීවාණුහරණය කරන්න.



පිදුරු සහිත පොලිසැක් මළු බැරලයේ අසුරන අයුරු

ඉන්ධන පිරිමැසුම් ලිප සාදා ගැනීම



ඉන්ධන පිරිමැසුම් ලිප

**අවශ්‍ය ද්‍රව්‍ය**

☛ ගඩොල් කැට 70
☛ අළු තාච්චි 01
☛ මැටි තාච්චි 02
☛ වැලි තාච්චි 02
☛ අමු ගොම තාච්චි 01
☛ කම්බි වලලු 02ක්

මැටි මිශ්‍රණයෙන් ලිප බැඳ සිමෙන්ති කපරාදුව යොදා ගැනීමෙන් මෙය දිගු කාලයක් නොකැඩී තබා ගත හැකිය.

2.2 **උතුරන ජලය මඟින් ජීවාණුහරණය**

කි.ග්‍රෑම් 1.5 ක වගා මළු 02 ක් සෑදීමට

☛ වියළි පිදුරු කි.ග්‍රෑම් 1.2 (ග්‍රෑම් 1200)
☛ ලීටර් 15 මූඩිය සහිත ප්ලාස්ටික් බාල්දියක්
☛ උතුරන ජලය ලීටර් 20ක් පමණ

මෙම ක්‍රමයට කලින් පිදුරු පෙඟවීම අනවශ්‍ය වේ. වියළි පිදුරු ප්ලාස්ටික් භාජනයට හොඳින් තදවන ලෙස දමා එයට උතුරන ජලය දමා මූඩිය හොඳින් වසන්න. මෙලෙස පැය 02ක් ජීවාණුහරණය කරගන්න. පසුව ලී මැස්ස මත ගොඩ ගසා වැඩි ජලය වෑස්සීමට අරින්න.

**3. බීජ යෙදීම සහ වගා මළු සෑදීම**

☛ පොලිතින් ග්‍රෑම් 500 - පළල 12", ඝණකම ගේජ් 150, අඟල් 17 දිගට මළු සාදා ගන්න.
☛ නිරෝගී ඔයිස්ටර් බිම්මල් බීජ මල්ලක්.
☛ කුඩා මුද්‍රාව සහිත රබර් මුදු.
☛ විෂ බීජ නාශකයක්.
☛ පොලිතීන් කි.ග්‍රෑම් 01ක් - පළල මීටර් 01 ඝණකම ගේජ් 300
☛ ඇල්පෙනිත්තක් / කුඩා කම්බි කැබැල්ලක්.

මීටර් 01 පළල ගේජ් 300 ඝණකම පොලිතීනය දෙකට කපා ගන්න. (පළල මීටර් 2) පසුව එය විෂබීජ නාශකයක් මඟින් විෂබීජ නාශනය කර පිරිසිදු ස්ථානයක එලා ගන්න. ජීවාණුහරණය කරගත් තෙතමනය 65% ඇති පිදුරු ඒ මත ගොඩගසන්න. පිදුරු ස්වල්පයක් අතට ගෙන මිරිකූ විට ඇඟිලිකරු අතරින් ජලය නොවෑස්සෙන අවස්ථාව 65% තෙතමනය අවස්ථාවයි. මෙය දිලීර වර්ධනය සඳහා යෝග්‍ය අවස්ථාව වන අතර පිදුරු වල තෙතමනය මීට වඩා වැඩි නම් දිලීර වර්ධනයක් සිදු නොවේ.

අඟල් 24 පළල පොලිතීන් මල්ල ගෙන කනපිට හරවා මුළු සකස් කරගන්න. පිදුරු කන්දෙන් ස්වල්පය බැගින් ඉදිරියට අදිමින් රවුම් කරමින් මල්ලේ ප්‍රමාණයට දරනුවක් සාදා ගන්න. එය පොලිතීන් මල්ල තුලට ඇතුල් කරගන්න. බීජ ස්වල්පයක් අතට ගෙන පොලිතීනය සහ පිදුරු ස්පර්ශ වන දාරය දිගේ බීජ යෙදා ඒ මත තවත් පිදුරු දරනුවක් තබා බීජ පෙර පරිදිම යොදන්න. මෙලෙස බෑගය කි.ග්‍රෑම් 1.5 වන ලෙස පිදුරු සහ බීජ යෙදීම සිදු කරන්න. අන්තිම කෙලවර පොලිතීන් කොටස අඹරවා රබර් මුදුවෙන් කම්බිකැබැල්ල ආධාරයෙන් මල්ලේ සිදුරු 80--100 පමණ ඇති කරන්න. සිදුරු නොමැති විට දිලීර වර්ධනය ඇනහිටීම හෝ දීර්ඝ කාලයක් ගත වේ. මෙලෙස බීජ යොදමින් වගා මළු සාදා ගන්න. (බීජ යෙදූ වගා මල්ලේ ප්‍රමාණය ඔබට කැමති ලෙස සකස් කර ගත හැකිය)

**04. බීජෞෂණයට වගා මළු සැකසීම හා බීජෞෂණය**

බීජෞෂණ කුටිය මේ සඳහා භාවිතා කරයි. එහි අඳුර 75% විය යුතු අතර උෂ්ණත්වය 26-28°C විය යුතුය.